සැ. යු. - 2012.03.16 වැනි දින පළවූ අංක 1,750 දරන ගැසට් පත්‍රයේ I/III සහ IV (A) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,751 - 2012 මාර්තු මස 23 වැනි සිකුරාදා - 2012.03.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | –– |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | –– |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | –– |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 410 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 410 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මාර්තු මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# රජයේ නිවේදන

එල්. ඩී. බී. 227/40

**(188 වැනි අධිකාරිය වූ) පුරාවස්තු ආඥාපනත**

19 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම

(188 වැනි අධිකාරිය වූ) පුරාවස්තු ආඥාපනතේ කාර්ය සඳහා මේ දැන්වීමෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ස්මාරකය, ආරක්ෂිත ස්මාරකයක් බවට ප්‍රකාශයට පත් කරමින් එම ආඥාපනතේ 18 වැනි වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කරන බව ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ජගත් බාලසූරිය වන මා විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී නියමය කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම් එම විරෝධතා 2012.04.09 දින හෝ එදිනට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතුය. එවැනි සෑම විරෝධතාවයක්ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, එම විරෝධතාව/විරෝධතා ඉදිරිපත් කරනු ලබන්නේ යම් හේතු මත ද එම හේතු පිළිබඳ ප්‍රකාශයක් එහි අන්තර්ගත විය යුතුය.

ආචාර්ය ජගත් බාලසූරිය,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2012 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට
පත්කරනු ලබන ස්මාරක ලේඛනය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 233 බී ඇම්පියාගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති ඇම්ටියාගොඩ විජේරත්න වලව්ව.

03-855

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - ලෝක වෙළඳ මධ්‍යස්ථානය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගනුදෙනුකරුගේ නම : ජනතා වතු සංවර්ධන මණ්ඩලය

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2012.02.29 වැනි දින පවත්වන ලද රැස්වීමේදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනත යටතේ ස්ථාපිත කරන ලද කොළඹ 02, වොක්ෂෝල් පටුමග, අංක 55/75 දරන ස්ථානයේ තම ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ඇත්තා වූ ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට දෙකම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් ලියා සහතික කරන ලද පිළිවෙළින් 1999 ජුනි මස 24 වැනි දිනැති අංක 737 සහ 2011 නොවැම්බර් මස 07 වැනි දිනැති අංක 1093 දරන උකස්කරයන් මත ද සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වී. එගොඩගේ විසින් ලියා සහතික කරන ලද 2004 සැප්තැම්බර් මස 02 වැනි දින හා අංක 272 දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

2011 ජුනි මස 20 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් එකසිය විසි අට මිලියන අට ලක්ෂ හතළිස් එක් දහස් හත්සිය අනූ හයයි ශත තිස් හතර (රු.128,841,796.34) ක මුදල සහ 2011.06.01 වන දින සිට එකී මුදල මත වර්ෂයකට සියයට විසි නමය (29%) බැගින් පොලිය ද, එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

එකී අංක 737, 1093 සහ 272 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් එකසිය විසි අට මිලියන අට ලක්ෂ හතළිස් එක් දහස් හත්සිය අනූ හයයි ශත තිස් හතර (රු.128,841,796.34) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දින දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල්ද එතෙක් ගෙවන ලද ගෙවීම් (යමක් වෙතොත්) එය අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තාවූ බැංකුව වෙත උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134 හි බලයලත් වෙන්දේසිකරු, පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරිය සහ බලය පවරන ලෙසය.

උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාග කෝරලයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අඹගමුවේ බලයලත් මානක එච්. ෂොක්මන් විසින් මැන සාදන ලද අංක 1964 මාර්තු 15 දින සැලැස්මේ දැක්වෙන ලෝවර් ඩිවිෂන්, ගලබොඩ ඩිවිෂන් සහ අපර් ඩිවිෂන් සමන්විත ගලබොඩ එස්ටේට් නමින් හඳුන්වනු ලබන බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති, 1998 ජුනි මස 26 වැනි දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පොදු අංක 01 උපලේඛනයේ පළමු වැනි (1) ඡේදය සාමාන්‍ය පළමුවැනි (1) කොටසෙහි විස්තර කර ඇති ඉඩම් ප්‍රමාණය අතහැර, 1982 මැයි මස 31 වන දින *ගැසට් පත්‍රයේ* අංක 195/6 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත අත්පත් කර දෙන ලද උතුරට : රජයේ ඉඩම; නැගෙනහිරට : පෙන්රොස් එස්ටේට් සහ දැව වගාව/කැලෑව; දකුණට : දැව වගාව/කැලෑව සහ මවුන්ට් ජින් එස්ටේට් සහ බස්නාහිරට : මවුන්ට් ජින් එස්ටේට් වේවැල්තලාව එස්ටේට් හා රජයේ ඉඩම් හා මායිම් තුල පිහිටි අක්කර අටසිය පනස් නමයයි රූඩ් එකයි පර්චස් තිස් හතර (අ. 859 රූ. 1, පර්. 34) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි තේ සහ වෙනත් වගාවන්, කර්මාන්ත ශාලා ගොඩනැගිලි බංගලාවන් (නිවාස) අනෙකුත් ගොඩනැගිලි ඇතුළු සියලු දේ වේ. ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 42/132 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පොන්නයියා ධර්මරට්නම්,
කළමණාකරු - ණය අයකර ගැනීම්.

03-905

පී. වී. 67606.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ටී වී එස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2009.04.22 දින සංස්ථාපිත සමාගමක් වන "ටී වී එස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ටී වී එස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-822

---

පී. වී. 20688.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "අමිල් ලංකා පේපර් මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2003.10.30 දින සංස්ථාපිත සමාගමක් වන "අමිල් ලංකා පේපර් මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "අමිල් ලංකා පේපර් මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-823

---

පී. වී. 81958.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "නිව් සිල්ක් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2011.10.20 දින සංස්ථාපිත සමාගමක් වන "නිව් සිල්ක් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "නිව් සිල්ක් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-824

---

පී. වී. 20711.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "එච් ඇන්ඩ් එස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2002.01.18 දින සංස්ථාපිත සමාගමක් වන "එච් ඇන්ඩ් එස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "එච් ඇන්ඩ් එස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-825

පී. වී. 20685.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "රිස්ලන් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2005.09.29 දින සංස්ථාපිත සමාගමක් වන "රිස්ලන් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "රිස්ලන් ඉන්වෙස්ට්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-826

---

පී. වී. 20706.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ක්ලබ් විලා රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1938 අංක 15 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1982.02.26 දින සංස්ථාපිත සමාගමක් වන "ක්ලබ් විලා රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ක්ලබ් විලා රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-827

---

පී. වී. 66433.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "මිල්ටන්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.12.05 දින සංස්ථාපිත සමාගමක් වන "මිල්ටන්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "මිල්ටන්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-828

---

පී. වී. 69941.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "එලිෆන්ට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2009.11.12 දින සංස්ථාපිත සමාගමක් වන "එලිෆන්ට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "එලිෆන්ට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-829

පී. වී. 20590.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "වර්ල්ඩ් ලින්ක් ඕගනයිසේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1995.02.22 දින සංස්ථාපිත සමාගමක් වන "වර්ල්ඩ් ලින්ක් ඕගනයිසේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "වර්ල්ඩ් ලින්ක් ඕගනයිසේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. කේ. හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

03-830

---

**මහජන බැංකුව - ගාල්ල කොටුව ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ඔක්තෝබර් මස 29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. සී. අරෝෂනී මිය විසින් 2005.11.14 වැනි දින සහ 2005.11.29 ඒ. ඩබ්. විපුලගුණ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 754/297 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ෆාතිමා සහීරා ඉෆ්තිකාර් මහරූෆ් හෙවත් ෆාතිමා සහීරා සාලි, අහමඩ් ඉෆ්තියාර් සිද්ධික් මහරූෆ් සහ අතීක සිද්ධික් මහරූෆ් හෙවත් ෂරීෆ් යන අයවලුන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තිස්ලක්ෂ අනූතුන්දහස් හත්සිය පනහ (රු. 30,93,750)ක මුදලක් මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින්ද, 2009.11.01 දින සිට වර්ෂයකට සියයට දහනමයයි දශම පහක (19.5%) බැගින් රුපියල් තිස්ලක්ෂ අනූතුන් දහස් හත්සිය පනහ (රු. 30,93,750)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තිස්ලක්ෂ අනූතුන්දහස් හත්සිය පනහ (රු. 30,93,750) අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 754 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කර ඇති දේපල පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ ගාල්ල මහනගර සභා සීමාවේ කුඹල්වැල්ලේ රිච්මන්ඩ් කන්ද පාරේ වරිපනම් අංක 24 දරන කලාසිගෙවත්තේ බෙදා වෙන්කළ අංක 1 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. අබවත්ත මහතා විසින් 2005.10.19 දින මැන සාදන ලද අංක 1007 දරන පිඹුර ප්‍රකාර එකී අංක 01 දරන කැබැල්ලට මායිම්, උතුරට : කලාසිගෙවත්තේ කැබැල්ලක් ද, නැගෙනහිර : සියඹලාගහවත්ත සහ පල්ලිය පාර සමග මෙම ඉඩමේ අංක 03 සහ කන්දවත්ත පාරේ වරිපනම් අංක 1/1 ද, දකුණට : මෙම ඉඩමේ කැබලි අංක 04 සහ 05 ද, බස්නාහිරට : එස්. එච්. දහනායක මාවතද, යන සතර මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම බින්දුවයි හයක් (අ. 0, රූ. 0, පර්. 13.06)ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ඇතුළු සියළු දේද වේ.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ436/95 යටතේ ලේඛනගතව ඇත.

ඉහත ඉඩමට යෑම් ඊම් සඳහා පහත සඳහන් ඉඩම් වල මාර්ග පරවශතා අයිතිය ද සමග වේ.

01. කුඹල්වැල්ලේ පිහිටි රිච්මන්ඩ් කන්ද පාරේ කලාසිගෙවත්තේ වරිපනම් අංක 22 සහ 24 දරන කැබලිවලට යාම සඳහා ඇති ප්‍රවේශ මාර්ගය වන අංක 04 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු සී. ආර්. අබවත්ත මහතා විසින් 1971.06.14 දින මැන සාදන ලද අංක 213 දරන පිඹුර ප්‍රකාර එකී අංක 04 දරන කැබැල්ලට මායිම්, උතුරට : මෙම ඉඩමේම අංක 01 දරන කැබැල්ලද, නැගෙනහිරට : මෙම ඉඩමේම අංක 3 දරන කැබැල්ල ද සහ වරිපනම් අංක 1/1 ද, දකුණට : මෙම ඉඩමේ අංක 2ඒ දරන කැබැල්ල ද, බස්නාහිරට : මෙම ඉඩමේ අංක 5 දරන කැබැල්ල ද, යන සතර මායිම් තුළ පිහිටි පර්චස් දශම පහයි තුන (අ. 0, රූ. 0, පර්.0.53)ක් විශාල ඉඩම.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ632/64 යටතේ ලියාපදිංචි කර ඇත.

02. කුඹල්වැල්ලේ පිහිටි රිච්මන්ඩ් කන්ද පාරේ කලාසිගෙවත්තේ වරිපනම් අංක 22 සහ 24 දරන කැබලිවලට යාම සඳහා ඇති ප්‍රවේශ මාර්ගය වන අංක 05 දරන කැබැල්ලට බලයලත් මිනින්දෝරු සී. ආර්. අබවත්ත මහතා විසින් 1971.06.14 දින මැන සාදන ලද අංක 213 දරන පිඹුර ප්‍රකාර එකී අංක 05 දරන කැබැල්ලට මායිම්, උතුරට : මෙම ඉඩමේම අංක 01 දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේම අංක 4 දරන කැබැල්ල ද, දකුණට : මෙම ඉඩමේ අංක 2ඒ දරන කැබැල්ල ද, බස්නාහිරට : රිච්මන්ඩ් කන්ද පාර ද යන සතර මායිම් තුළ පිහිටි පර්චස් එකයි දශම අටයි එක (අ. 0, රූ. 0, පර්. 1.81)ක් විශාල ඉඩම.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 632/63 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

03-928

**මහජන බැංකුව - ගාල්ල කොටුව ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010 නොවැම්බර් මස 29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කරන ලද 2008.10.28 දිනැති අංක 3064 සහ 3065 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්, සුවිනීතා පතිරවසම් මිය සහ අහංගම ලියනගේ අජන්තා අමරජීවනී මිය යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කර යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ පනස්හත්දහස් තුන්සිය විසිහයයි ශත හැත්තෑ එක (රු. 3,57,336.71)ක මුදලක් සහ රුපියල් අටලක්ෂ හතලිස් එක්දහස් අටසිය විසි එකයි ශත හතලිස් තුන (රු. 8,41,821.43)ක මුදල් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, 2010.04.05 දින සිට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් රුපියල් තුන්ලක්ෂ පනස් හත්දහස් තුන්සිය විසිහයයි ශත හැත්තෑ එක (රු. 3,57,326.71)ක මුදල සහ 2010.04.05 දින සිට වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් රුපියල් අටලක්ෂ හතලිස් එක්දහස් අටසිය විසි එකයි ශත හතලිස් තුන (රු. 8,41,821.43)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ පනස් හත්දහස් තුන්සිය විසිහයයි ශත හැත්තෑ එක (රු. 3,57,326.71)ක මුදලක් සහ රුපියල් අටලක්ෂ හතලිස් එක්දහස් අටසිය විසි එකයි ශත හතලිස් තුන (රු. 8,41,821.43) මුදල් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් 3064 සහ 3065 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ කිතුලම්පිටිය පිහිටි යද්දෙහිවත්ත නොහොත් පිටිවලවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. සමරරත්න මහතා විසින් 1996.08.18 දින මැන සම්පාදිත අංක 1450 පිඹුර පරිදි අංක 05 දරන කැබැල්ල සඳහා මායිම්, උතුරට : අංක 6 කැබැල්ල (පාර) සහ කැබලි අංක 4, නැගෙනහිරට : අංක 4 දරන කැබැල්ල සහ යද්දෙහිවත්ත නොහොත් පිටිවලවත්තෙහි අංක 02 දරන කැබැල්ල ද, දකුණට : යද්දෙහිවත්ත නොහොත් පිටිවලවත්තෙහි අංක 2 දරන කැබැල්ල සහ ආනන්ද මාවතද, බටහිරට : ආනන්ද මාවත සහ කැබලි අංක 6 (අඩි 12 පළල පාර) යන සතර මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම හයයි හත (අ. 0, රූ. 0, පර්. 6.67)ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි ඇතුළු සියළු දේද වේ.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ636/231 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

03-929

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.